## 11 ශ්‍රේණිය - පළමු වාරය, 2020

## ඉතිහාසය 2

*සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.*

1) පහත සඳහන් ඓතිහාසික ස්ථාන ශ්‍රී ලංකා සිතියමක හා ලෝක සිතියමක ලකුණු කර නම් කරන්න.

   i. ලංකා සිතියමක

      a. ගාල්හ නදී, ලංකා පටුන, ඉබ්බන්කටුව, නල්ලූර්, ඌරා තොට, පාහියන්ගල, මහා වාලුකා නදී, ගන්නෝරුව, මිනිපේ අමුණ, පේදුරුතුඩුව, යෝධ වැව, කාලතිත්ථ.

   ii. ලෝක සිතියමක

      a. මියන්මාරය, චීනය, කොන්ස්තන්තිනෝපලය, සුවස් ඇළ, කැලිකට්, ඕලන්දය.

2)

   i. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් මානවයා ජීවත් වූ පරිසර කලාප තුනක් නම් කරන්න.

   ii. ශ්‍රී ලංකාවේ දකුණු පළාතට අයත් අර්ධ ශුෂ්ක කලාපයේ ප්‍රාග් ඓතිහාසික මෙවලම් හමුවී ඇති ස්ථාන හතරක් නම් කරන්න.

   iii. පූර්ව ඓතිහාසික යුගයේ මානවයා තාක්ෂණය භාවිතා කළ ආකාරය කරුණු දෙකකින් විස්තර කරන්න.

   iv. මුල් ඓතිහාසික යුගයේ සුවිශේෂ ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න.

3)

   i. මහාවංශයේ සඳහන් වාපිගාම තුනක් නම් කරන්න.

   ii. පහත සඳහන් රාජ්‍යත්ව සංකල්ප වලට අදාළ පාලකයින් පිළිවෙලින් නම් කරන්න.

      a. දේවත්ව
      b. නරේශ්වර
      c. චක්‍රවර්ති
      d. ආලකමන්දපති

   iii. දුටුගැමුණු රජතුමාගේ ආගමික හා දේශපාලන සේවාවන් එක බැගින් සඳහන් කර විස්තර කරන්න.

   iv. පැරණි ශ්‍රී ලාංකික සමාජය වාර්ගික සහජීවනයෙන් කටයුතු කළ බව උදාහරණ තුනකින් පහදන්න.

4)

i. වැවක අංග තුනක් නම් කරන්න.
ii. භික්ෂූන් වහන්සේලා සඳහා මෙන්ම ජල අවශ්‍යතා ඉටුකරගැනීමට ඉදිකළ පොකුණු හතරක් නම් කරන්න.
iii. අතීතයේ යකඩ නිස්සාරණය සිදු කළ ආකාර නිදසුන් දෙකක් මගින් පහදන්න.
iv. අපේ පැරැන්නන් දියුණු වාස්තු විද්‍යාත්මක ක්‍රම අනුගමනය කර ඇති බව කරුණු 3කින් පැහැදිලි කරන්න.

5)

i. ශ්‍රී ලංකාවේ පළමු නාගරීකරණ අවධියට අයත් පැරණි පරිපාලන නගර තුනක් නම් කරන්න.
ii. කෝට්ටේ යුගයේ රචනා කරන ලද සංදේශ කාව්‍ය දෙකක් හා ඉදිකරන ලද පිරිවෙන් දෙකක් නම් කරන්න.
iii. හතරවන පරාක්‍රමබාහු රජ සමයේ සුවිශේෂී සිදුවීම් දෙකක් පැහැදිලි කරන්න.
iv. මහනුවර රාජධානියේ ආරම්භක පාලකයා වූ පළමුවන විමලධර්මසූරිය රජු මුහුණ දුන් අභියෝග තුනක් සැකෙවින් පහදන්න.

6)

i. කාර්මික විප්ලව සමයේ බිහි වූ නිර්මාණ තුනක් පහත දැක්වේ. ඒවායේ නිර්මාණකරුවන් පිළිවෙලින් නම් කරන්න.

   a. රෝලර් යන්ත්‍රය.
   b. දුවන නඩාව.
   c. රූපවාහිණිය.

ii. කාර්මික විප්ලවය බ්‍රිතාන්‍ය තුළ ම ආරම්භ වීමට බලපෑ හේතු හතරක් නම් කරන්න.
iii. දේශපාලන ක්ෂේත්‍රයේ වෙනසක් ඇති කිරීමට කාර්මික විප්ලවය බලපෑ අයුරු කරුණු දෙකකින් පහදන්න.
iv. කාර්මික විප්ලවය ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑ ආකාරය කරුණු තුනකින් පැහැදිලි කරන්න.